# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

**[සහතිකය සටහන් කළේ 2017 ජූලි මස 28 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.


2017 ජූලි මස 28 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 21.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

# 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

[සහතිකය සටහන් කළේ 2017 ජූලි මස 28 වන දින]

එල්.ඩී—ඕ. 42/2003

**විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද; විදේශ විනිමය ප්‍රවර්ධන කිරීම සහ නියාමනය කිරීම පිළිබඳ වගකීම රජයේ නියෝජිත වශයෙන් මහ බැංකුව වෙත පැවරීම සඳහා ද; (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත ඉවත් කිරීම සඳහා විධිවිධාන සැලසීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු ''නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

මහ බැංකුව විසින් පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම දැරිය යුතු බව.

**2.** (1) ශ්‍රී ලංකාවේ විදේශ විනිමය නිසි ලෙස ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම සහතික කරනු පිණිස මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම, මේ වගන්තිය යටතේ තත් කාර්යය සඳහා කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව රජයේ නියෝජිත වශයෙන් මහ බැංකුව විසින් දරනු ලැබිය යුතු ය.

(2) මහ බැංකුව විෂයය පැවරී ඇති අමාත්‍යවරයා විසින් වරින් වර, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර එම විධාන ක්‍රියාත්මක කරවීම, මුදල් මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

මහ බැංකුව විසින් බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටු කළ යුතු බව.

**3.** මේ පනතේ යම් විධිවිධානයක් යටතේ මහ බැංකුව විසින් යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කළ යුතු බවට, ඉටු කළ යුතු බවට හෝ කළ යුතු බවට බලය දෙනු ලැබ ඇති හෝ නියම කරනු ලැබ ඇති අවස්ථාවක දී, එම බලතලය, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම මහ බැංකුවේ අධිපතිවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස නම් කරනු ලැබ ඇති නිලධරයා හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ සහායක ලෙස නම් කරනු ලැබ ඇති වෙනත් යම් නිලධරයකු විසින් සිදු කරනු ලැබිය යුතු ය.

2—PL 005160—2,861 (2017/04)

බලයලත් වෙළෙන්දන් සහ පරිසීමිත වෙළෙන්දන්.

**4.** (1) (අ) බැංකු කටයුතු කරගෙන යාම පිණිස 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවකට ම එසේ බලපත්‍ර නිකුත් කරනු ලැබීමෙන් ඉක්බිතිව ම, 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට බලයලත් වෙළෙන්දකු ලෙස ක්‍රියාකිරීම පිණිස මහ බැංකුව විසින් බලය දිය යුතු ය.

(ආ) නියමිත දිනයේ දී බැංකු කටයුතු කරගෙන යන සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවකට ම 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට බලයලත් වෙළෙන්දකු ලෙස ක්‍රියා කිරීම පිණිස මහ බැංකුව විසින් බලය දෙන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) බැංකු කටයුතු කරගෙන යාම පිණිස 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට ම එසේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් ඉක්බිතිව ම, 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, බලය ලබාදීමේ දී නිශ්චිතව සඳහන් කරන ලද කාර්ය සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට බලයලත් වෙළෙන්දකු ලෙස ක්‍රියාකිරීම පිණිස මහ බැංකුව විසින් බලය ලබා දිය හැකි ය.

(ඈ) නියමිත දිනයේ දී බැංකු කටයුතු කරගෙන යන සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට ම, 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, බලය ලබාදීමේ දී නිශ්චිතව සඳහන් කරන ලද කාර්ය සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට බලයලත් වෙළෙන්දකු ලෙස ක්‍රියා කිරීම පිණිස මහ බැංකුව විසින් බලය ලබා දෙන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (අ) 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මහ බැංකුව විසින්, බලයලත් වෙළෙන්දකු නොවන්නා වූ (මෙහි මින්මතු මේ පනතෙහි "පරිසීමිත වෙළෙන්දා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට, තැනැත්තන් වර්ගයකට හෝ වර්ගවලට, තත් කාර්යය සඳහා මහ බැංකුව විසින් පනවනු ලැබිය හැකි නියමවලට සහ කොන්දේසිවලට යටත්ව අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කරන ලද කාර්ය සඳහා ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය වෙළෙඳාම් කිරීම පිණිස අවසර දෙනු ලැබිය හැකි ය.

(ආ) නියමිත දිනයේ දී විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට අවසර ලබා දී ඇති, බලපත්‍රලාභී වාණිජ බැංකු හෝ විශේෂිත බැංකු හැර මුදල් මාරු කරන්නන් හෝ වෙනත් යම් තැනැත්තකු ද ඇතුළු සෑම

විදේශ විනිමය වෙළෙන්දකුට ම, 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, බලය ලබාදීමේ දී නිශ්චිතව සඳහන් කරන ලද කාර්ය සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට බලයලත් වෙළෙන්දකු ලෙස ක්‍රියා කිරීම පිණිස මහ බැංකුව විසින් බලය දෙන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මහ බැංකුව විසින්, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන්නා වූ යම් තැනැත්තන්ට, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි කාර්ය සඳහා සහ එවැනි නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය වෙළෙඳාම් කිරීම පිණිස විශේෂ අවසරයක් දෙනු ලැබිය හැකි ය.

(3) මේ පනතින් අන්‍යාකාර ලෙසින් විධිවිධාන සලසා ඇති පරිදි හැරෙන්නට, ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් බලයලත් වෙළෙන්දකුගේ මාර්ගයෙන් හෝ අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් ප්‍රමාණය තෙක් පරිසීමිත වෙළෙන්දකුගේ මාර්ගයෙන් හෝ හැර, ශ්‍රී ලංකා රුපියල් හෝ ශ්‍රී ලංකාව තුළ වත්කම් විදේශ විනිමයට පරිවර්තනය කිරීමට සම්බන්ධිත යම් ක්‍රියාවක් මගින් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව විදේශ විනිමය වෙළෙඳාම් නොකළ යුතු ය.

ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික පුද්ගලයකු විසින් දරන හෝ එවැනි පුද්ගලයකුට අයිතිව තිබෙන විදේශ විනිමය හෝ විදේශ වත්කම්.

**5.** ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික -

(අ) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර බැංකු ගිණුමක විදේශ විනිමය දරන්නේ නම්; හෝ

(ආ) යම් තැනැත්තකුට යම් විදේශ වත්කමක් අයිතිව තිබෙන්නේ නම්,

ඒ විදේශ විනිමය හෝ විදේශ වත්කම, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර එවන් තැනැත්තකුගේ යම් ජංගම හෝ ප්‍රාග්ධන ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ යම් ගෙවීමක් කිරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් භාවිත කරනු ලැබිය හැකි ය. ඒ තැනැත්තා දරන

විදේශ විනිමයෙන් ශ්‍රී ලංකාව තුළ දී කරනු ලබන එවැනි යම් ගෙවීමක්, බලයලත් වෙළෙන්දකු මාර්ගයෙන් හෝ අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයට, පරිසීමිත වෙළෙන්දකු මගින් කරනු ලැබිය යුතු ය.

ජංගම ගනුදෙනුව.

**6.** (1) යම් තැනැත්තකුගේ ජංගම ගනුදෙනුවක් සඳහා, බලයලත් වෙළෙන්දකුගේ මාර්ගයෙන් හෝ අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයට පරිසීමිත වෙළෙන්දකුගේ මාර්ගයෙන්, විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.

(2) බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ජංගම ගනුදෙනුවක් සඳහා ප්‍රධානයකු ලෙසින් හෝ මැදිහත්කරුවකු ලෙසින් විදේශ විනිමය වෙළෙඳාම් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ජංගම ගනුදෙනුවක් සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට ප්‍රථම, විදේශ විනිමය අවශ්‍ය වන්නේ ජංගම ගනුදෙනුවකට අදාළව බවට සහ ඒ ගනුදෙනු විධිමත් කරන්නා වූ වෙනත් යම් නීතියකට අනුකූල බවට තමාට සෑහීමකට පත්වීමට හැකි වනු පිණිස, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්, ඒ ගනුදෙනුව සඳහා විනිමය අවශ්‍ය කරන්නා වූ තැනැත්තාගෙන් ඒ තොරතුරු සපයන ලෙස හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙස හෝ සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ප්‍රකාශයක් කරන ලෙස හෝ ඉල්ලා සිටිය යුතු ය.

(4) ගනුදෙනුවක් සම්බන්ධයෙන් (3) වන උපවගන්තියේ ප්‍රකාර තොරතුරු, ලේඛන හෝ ප්‍රකාශයක් සැපයීම සඳහා වූ ඉල්ලීම ඉටු නොකළ අවස්ථාවක හෝ අවශ්‍යතාවය ජංගම ගනුදෙනුවක් සඳහා නොවන බවට හෝ ඒ ගනුදෙනු විධිමත් කරන්නා වූ වෙනත් යම් නීතියකට අනුකූල නොවන බවට හෝ වෙළෙන්දා සෑහීමකට පත් වූ අවස්ථාවක, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් (1) වන උපවගන්තිය යටතේ ජංගම ගනුදෙනුවක් සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කිරීම ප්‍රතික්ෂේප කළ යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ ජංගම ගනුදෙනුවක් සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කිරීම ප්‍රතික්ෂේප කරන බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්, විදේශ විනිමය අවශ්‍ය කරන තැනැත්තා විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව තමාගේ තීරණය ඒ සඳහා වූ හේතු ද සමඟ එම විදේශ විනිමය අවශ්‍ය කරන තැනැත්තාට ලිඛිතව දැනුම් දිය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ගනු ලැබූ තීරණයෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින් ඒ තැනැත්තා වෙත ඒ තීරණය දැනුම් දීමෙන් පසු දින දාහතරක් තුළ දී මහ බැංකුව වෙත ඒ තීරණයට විරුද්ධව අභියාචනය කළ හැකි අතර, ඒ තැනැත්තාට සහ වෙළෙන්දාට සවන් දීම පිණිස සාධාරණ අවස්ථාවක් ඔවුනට සලස්වා දීමෙන් පසු මහ බැංකුව විසින් ඒ තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ යුතු ය.

**7.** (1) මුදල් මණ්ඩලය විමසා සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සහිතව අමාත්‍යවරයා විසින්, මේ වගන්තියේ කාර්ය සඳහා වූ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ගය හෝ වර්ග සඳහා නියෝග මගින් බලය දෙනු ලැබිය යුතු ය. ප්‍රාග්ධන ගනුදෙනුව.

(2) (1) වන උපවගන්තිය යටතේ නියෝග සෑදීමේ දී අමාත්‍යවරයා විසින්-

(අ) ශ්‍රී ලංකා රජය අත්සන්කරුවකු වන ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනුවකට අදාළ යම් ගිවිසුමකට හෝ එකඟතාවයකට අනුකූලව විධිමත් කරනු ලැබිය යුතු වන ගනුදෙනු සම්බන්ධයෙන්;

(ආ) එසේ බලය දෙනු ලැබීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තියට සහ ස්ථාවරත්වයට ඇති වන බලපෑම සම්බන්ධයෙන්,

සැලකිල්ල දැක්විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද නියෝගවල, ප්‍රාග්ධන ගනුදෙනු සඳහා බලය දෙනු ලැබිය හැකි වනුයේ කවර සීමාවක් තෙක් ද සහ එසේ බලය දෙනු ලැබූ ප්‍රාග්ධන ගනුදෙනු

වර්ගය හෝ වර්ග සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කළ හැකි වන්නේ කවර නියම සහ කොන්දේසි යටතේ ද යන වග නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය.

(4) 5 වන වගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් බලය දෙන ලද වර්ගයකට හෝ වර්ගවලට අයත් ප්‍රාග්ධන ගනුදෙනුවක් වන්නා වූ, යම් තැනැත්තකුගේ ප්‍රාග්ධන ගනුදෙනුවක් සම්බන්ධයෙන් බලයලත් වෙළෙන්දකු මාර්ගයෙන් හෝ අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් ප්‍රමාණයට පරිසීමිත වෙළෙන්දකු මාර්ගයෙන් විදේශ විනිමයෙන් වෙළෙඳාම් කිරීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතු ය.

(5) බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්, (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් බලය දෙන ලද ගනුදෙනුවක් වන්නා වූ ප්‍රාග්ධන ගනුදෙනුවක් සඳහා ප්‍රධානයකු ලෙසින් හෝ මැදිහත්කරුවකු ලෙසින් විදේශ විනිමය වෙළෙඳාම් කරනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තිය යටතේ ප්‍රාග්ධන ගනුදෙනුවක් සම්බන්ධයෙන් විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට පෙරාතුව, එය (1) වන උපවගන්තිය යටතේ බලය දෙන ලද ප්‍රාග්ධන ගනුදෙනුවකට අදාළ අවශ්‍යතාවක් බවටත් එය එවැනි ගනුදෙනු විධිමත් කෙරෙන වෙනත් නීතිවලට අනුකූල බවටත් තමාට සෑහීමට පත්වීමට හැකිවනු පිණිස සාධාරණ ලෙස අවශ්‍ය කරනු ලබන තොරතුරු හෝ ලේඛන සපයන ලෙස හෝ ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා විසින් ඒ ගනුදෙනුව සඳහා විදේශ විනිමය අවශ්‍ය කරන තැනැත්තාගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(7) තොරතුරු, ලේඛන හෝ ප්‍රකාශයක් සපයන ලෙස කරන ලද ඉල්ලීමක් ඉටු නොකළ අවස්ථාවක හෝ අවශ්‍යතාවය (1) වන උපවගන්තිය යටතේ බලය දෙන ලද ප්‍රාග්ධන ගනුදෙනුවක් සඳහා නොවන බවට හෝ එය එවැනි ගනුදෙනු විධිමත් කෙරෙන වෙනත් නීතිවලට අනුකූල නොවන බවට වෙළෙන්දා සෑහීමකට පත් වූ අවස්ථාවක දී, බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා විසින් මේ වගන්තිය යටතේ ප්‍රාග්ධන ගනුදෙනුවක් සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කිරීම ප්‍රතික්ෂේප කළ යුතු ය.

(8) මේ වගන්තිය යටතේ ප්‍රාග්ධන ගනුදෙනුවක් සම්බන්ධයෙන් විදේශ විනිමය වෙළෙඳාම් කිරීම ප්‍රතික්ෂේප කරන බලයලත්

වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් විදේශ විනිමය අවශ්‍ය කරන තැනැත්තා විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව තමාගේ තීරණය ඒ සඳහා වූ හේතු ද සමඟ එම විදේශ විනිමය අවශ්‍ය කරන තැනැත්තා වෙත ලිඛිතව දැන්විය යුතු ය.

(9) (7) වන උපවගන්තිය යටතේ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ගනු ලැබූ තීරණයෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින් ඒ තැනැත්තා වෙත ඒ තීරණය දැනුම් දීමෙන් පසු දින දාහතරක් ඇතුළත දී මහ බැංකුව වෙත ඒ තීරණයට විරුද්ධව අභියාචනය කළ හැකි අතර, ඒ තැනැත්තාට සහ වෙළෙන්දාට සවන් දීම පිණිස සාධාරණ අවස්ථාවක් ලබා දීමෙන් පසු ඒ තීරණය මහ බැංකුව විසින් ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ යුතු ය.

(10) මුදල් මණ්ඩලය විසින්, ව්‍යතිරේක අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, (1) වන උපවගන්තිය යටතේ දෙන ලද අනුමතයන්ට අනුකූලව අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුව ඒ ප්‍රාග්ධන ගනුදෙනුවට අනුමතය දී ඇත්තේ නම් මිස, (1) උපවගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් බලය ලබා දී නැති ප්‍රාග්ධන ගනුදෙනුවක් සඳහා බලයලත් වෙළෙන්දකු විසින් හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් විදේශ විනිමය වෙළෙඳාම් නොකළ යුතු ය.

ඇතැම් ගනුදෙනු විධිමත් කළ යුතු බව.

**8.** (1) ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික තැනැත්තකු විසින්-

(අ) යම් විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමේ හෝ ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ, විදේශ විනිමය තම සන්තකයේ හෝ බැංකු ගිණුමක තබා ගැනීම,

අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි කාර්යයක් සඳහා පමණක් එම සීමාවන් දක්වා සහ එම නියමයන් සහ කොන්දේසිවලට යටත්ව සිදු කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීම මගින් හෝ ශ්‍රී ලංකාව තුළ ඇති වත්කමක් බැහැර කිරීම හෝ පරිවර්තනය කිරීම මගින් හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ සිට බැහැරට යම් සේවාවක් සැපයීමෙන් උපයාගනු ලැබූ විදේශ විනිමය මගින් විදේශ වත්කමක් අත්පත් කර ගැනීම, තත් කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය හැකි කාර්යයක් සඳහා පමණක් එම සීමාවන් දක්වා සහ එම නියමයන් සහ කොන්දේසිවලට යටත්ව සිදු කරනු ලැබිය යුතු ය.

(3) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, නියමිත දිනයට පෙර දේශීය ආදයම් කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත ප්‍රකාශයට පත් කර නොමැති සහ 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත හෝ (26 වන අධිකාරය වූ) අල්ලස් පනත යටතේ අධිකරණයක දී දැනට නඩු කටයුතු පවත්වාගෙන යනු ලබන හෝ අධිකරණයක් විසින් නියෝගයක් නිකුත් කරනු ලැබ ඇති දේපළක් නොවන යම් විදේශ විනිමය ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියකු, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත සියයට එකක ප්‍රේෂණ ගාස්තුවක් පමණක් ගෙවීමට යටත් විය යුතු අතර වෙනත් යම් ගාස්තුවක්, බද්දක්, අධිභාරයක්, අය කිරීමක් හෝ දඩයක් ගෙවීමට යටත් නොවිය යුතු ය:

එසේ වුව ද, වටිනාකම ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියනය නොඉක්මවන ශ්‍රී ලංකාවෙන් පිටත පවතින විදේශ විනිමය ප්‍රමාණයක් ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරන එවැනි යම් තැනැත්තකු ප්‍රේෂණ ගාස්තුව හෝ වෙනත් යම් බද්දක්, අධිභාරයක්, අයකිරීමක් හෝ දඩයක් ගෙවීමට යටත් නොවිය යුතු අතර එම වටිනාකම ඉක්මවා ප්‍රේෂණය කරන ලද යම් විදේශ විනිමය ප්‍රමාණයක් (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රේෂණ ගාස්තුවක් ගෙවීමට යටත් විය යුතු ය:

එසේ වුව ද, තවදුරටත්, වටිනාකම ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියනය ඉක්මවන ශ්‍රී ලංකාවෙන් පිටත පවතින විදේශ විනිමය ප්‍රමාණයක් ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරනු ලබන සහ එසේ ප්‍රේෂණය කරනු ලබන විදේශ විනිමය ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද සංවර්ධන බැඳුම්කරයක ආයෝජනය කරනු ලබන එවන් යම් තැනැත්තකු ප්‍රේෂණ ගාස්තුව හෝ වෙනත් යම් බද්දක්, අධිභාරයක්, අයකිරීමක් හෝ දඩයක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

(4) ශ්‍රී ලංකාවෙන් පිටත පවතින සහ (3) වන උපවගන්තිය යටතේ නියමිත දිනයට පසුව ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරනු ලබන විදේශ විනිමය, විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක පවත්වා ගැනීම හෝ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම සිදු කළ හැකි ය.

(5) (3) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ දේපළ, මහ බැංකුවේ අවසරයකින් තොරව ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගනු ලැබ ඇති වුව ද, එම දේපළ 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ වරදක් සිදු කිරීම මගින් ලබා ගන්නා ලද දේපළක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

(6) 8 වන වගන්තියේ (3) වන උපවගන්තියේ නියමයන්ට අනුව යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරන ලද අරමුදල් නැවත ශ්‍රී ලංකාවෙන් බැහැර සියරට වෙත යැවීම මත කිසිදු සීමාවක් නොතිබිය යුතු ය.

මාර්ගෝපදේශ සහ විධාන.

**9.** (1) අමාත්‍යවරයා වෙත දැනුම් දීමට යටත්ව, මහ බැංකුව විසින් කලින් කල, ජංගම ගනුදෙනුවල නිරතව සිටින බලයලත් වෙළෙන්දන් සහ පරිසීමිත වෙළෙන්දන් වෙත මාර්ගෝපදේශ සහ විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව මහ බැංකුව විසින් කලින් කලට ප්‍රාග්ධන ගනුදෙනුවල නිරතව සිටින බලයලත් වෙළෙන්දන් සහ පරිසීමිත වෙළෙන්දන් වෙත මාර්ගෝපදේශ සහ විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව මහ බැංකුව විසින් කලින් කල, (1) සහ (2) උපවගන්තිවල සඳහන් කරන ලද ගනුදෙනු හැර විදේශ විනිමය සම්බන්ධ අනෙකුත් ගනුදෙනුවල නිරතව සිටින බලයලත් වෙළෙන්දන් සහ පරිසීමිත වෙළෙන්දන් වෙත මාර්ගෝපදේශ සහ විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව, මහ බැංකුව විසින්, කලින් කලට 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට අවසර ලබා දී ඇති බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන යම් තැනැත්තකු, තැනැත්තන් වර්ගයක් හෝ වර්ග වෙත මාර්ගෝපදේශ සහ විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(5) සංඛ්‍යා ලේඛනමය සහ අධීක්ෂණ කාර්ය සඳහා මහ බැංකුව විසින්, වෙළෙන්දා වෙත ඉල්ලීම දැනුම්දීමට පෙරාතුව ම වූ අවුරුදු හයක කාලයක් සඳහා වෙළෙන්දා විසින් නිරතව සිටි ඕනෑම විදේශ විනිමය ගනුදෙනුවකට අදාළව ඉල්ලා සිටි පරිදි වූ ආකෘතියෙන් සහ ආකාරයෙන් වූ තොරතුරු සහ වාර්තා, ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන කාලය තුළ දී සපයන ලෙස බලයලත් වෙළෙන්දකුගෙන් හෝ පරිසීමිත වෙළෙන්දකුගෙන් ඉල්ලා සිටිය හැකි ය.

විදේශ විනිමය ගනුදෙනු සහ විදේශ වත්කම් විමර්ශනය කිරීම.

**10.** (1) කවර හෝ වේලාවක මහ බැංකුව විසින් අවස්ථාවෝචිත පරිදි යම් බලයලත් වෙළෙන්දකුගේ හෝ පරිසීමිත වෙළෙන්දකුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ, තැනැත්තන් වර්ගයක හෝ වර්ගවල විදේශ විනිමය ගනුදෙනු හෝ විදේශ වත්කම් පිළිබඳව, මහ බැංකුව විසින් ලිඛිතව ඒ සඳහා බලය දෙන ලද (මෙහි මින්මතු "බලයලත් තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නිලධරයකු මගින් විමර්ශනයක් කරනු ලැබිය හැකි ය.

(2) (අ) ඒ විමර්ශනයේ කාර්ය සඳහා යම් පරිශ්‍රයකට ඇතුළු වීමට බලයලත් තැනැත්තකුට අවසර ලබා දීම;

(ආ) එම බලයලත් තැනැත්තාට එම විමර්ශනය සඳහා අවශ්‍ය විය හැකි යම් පොත් හා අනෙකුත් ලේඛන ඉදිරිපත් කිරීම;

(ඇ) එම බලයලත් තැනැත්තාට එම පොත් සහ අනෙකුත් ලේඛන අවශ්‍ය විය හැකි කාලයක් සඳහා තබා ගැනීමට හෝ ඒවායේ පිටපත් හෝ උද්ධෘත ගැනීමට අවසර ලබා දීම;

(ඇ) බලයලත් තැනැත්තා විසින් එසේ නියම කරනු ලැබූ විට බලයලත් තැනැත්තා ඉදිරියේ පෙනී සිටීම;

(ඉ) එකී බලයලත් තැනැත්තා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ යම් කාලයක් ඇතුළත සහ එම ආකාරයෙන් විමර්ශනයට අදාළ ප්‍රකාශ හෝ තොරතුරු සැපයීම; හෝ

(ඊ) මේ වගන්තිය යටතේ එම ගනුදෙනුකරුගේ දැනීමට අනුව සාවද්‍ය වන තොරතුරු සැපයීමෙන් වැළකීම,

සෑම බලයලත් වෙළෙන්දකුගේ හෝ පරිසීමිත වෙළෙන්දකුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ, තැනැත්තන් වර්ගයක හෝ වර්ගවල කර්තව්‍යය විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ බලයලත් තැනැත්තකු විසින් යම් පොතක් හෝ ලේඛනයක් රඳවා තබා ගත් අවස්ථාවක, ඒ පොත හෝ ලේඛනය රඳවා තබා ගැනීම පිණිස ලබා ගන්නා ලද්දේ කවර තැනැත්තකුගේ භාරය තුළින් හෝ පාලනයෙන් ද ඒ තැනැත්තා විසින් පිටපතක් සඳහා ඉල්ලීමක් කරනු ලැබුවහොත්, ඒ බලයලත් තැනැත්තා විසින් සහතික කරන ලද ඒ පොතේ හෝ ලේඛනයේ පිටපතක්, බලයලත් තැනැත්තා විසින් ඒ පොත හෝ ලේඛනය රඳවා තබා ගැනීම පිණිස ලබා ගත්තේ කවර තැනැත්තකුගේ භාරය තුළින් හෝ පාලනය පිට ද ඒ තැනැත්තා වෙත සැපයීම හෝ මුල් පොත හෝ ලේඛනය රඳවා තබා නොගෙන එම පොතේ හෝ ලේඛනයේ සත්‍ය පිටපත් සපයන ලෙස නියම කිරීම සිදු කළ යුතු ය.

(4) බලයලත් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටීමට නියම කරනු ලැබූ බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ වෙනත් තැනැත්තකු වාචිකව පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, ඒ වෙළෙන්දා හෝ තැනැත්තා විසින් කරනු ලබන යම් ප්‍රකාශයක් ලියවිල්ලකින් විය යුතු ය; තවද, ඒ ලියවිල්ල සකස් කරන වෙළෙන්දා හෝ තැනැත්තා විසින් එය අත්සන් කරනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ විමර්ශනයක් කිරීමේ කාර්ය සඳහා, මහ බැංකුව හෝ බලයලත් තැනැත්තා විසින්, ඒ අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී සාමය කඩවීමක් වැළැක්වීම පිණිස පොලිස් නිලධරයකුගේ සහාය, අවස්ථානුගතව අවශ්‍ය වන්නේ නම් ලබා ගත හැකි ය.

(6) (1) වන උපවගන්තිය යටතේ විමර්ශනයක් කරගෙන යාමේ දී මහ බැංකුවට යම් ප්‍රතිරෝධයක් එල්ල වූ අවස්ථාවක, මහ බැංකුව විසින් ඒ විමර්ශනය කරනු ලබන්නේ කවර මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත තත් කාර්යය සඳහා මුදල් මණ්ඩලය විසින් බලය ලබා දෙන ලද යම් තැනැත්තකු විසින් කරන ලද ඉල්ලීමක් මත, විදේශ විනිමය ගනුදෙනු හෝ විදේශ වත්කම් හෝ පිළිබඳව විමර්ශනය කරන්නේ හෝ කරගෙන යමින් සිටින්නේ හෝ කරගෙන යනු ලැබිය යුත්තේ කවර බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ වෙනත් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ වෙළෙන්දාට හෝ තැනැත්තාට බලයලත් තැනැත්තා ඉදිරියේ පෙනී සිටීමට නියම කෙරෙන හෝ මහ බැංකුව විසින් හෝ විමර්ශනය කරගෙන යනු ලබන බලයලත් තැනැත්තා විසින් ඒ විමර්ශනය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය කරනු ලබන, ඒ වෙළෙන්දාගේ හෝ තැනැත්තාගේ භාරයේ පවතින හෝ පාලනයේ ඇති පොත් හෝ ලේඛන ඉදිරිපත් කිරීමට විධාන කෙරෙන නියෝගයක් ලබා ගත හැකි ය.

(7) (6) වන උපවගන්තිය යටතේ වූ තත් කාර්යය සඳහා මුදල් මණ්ඩලය විසින් බලය ලබා දෙන ලද තැනැත්තා විසින් කරන ලද ඉල්ලීමකː-

(අ) විදේශ විනිමය ගනුදෙනුව විමර්ශනය කරගෙන යනු ලබන්නේ හෝ කරගෙන යනු ලැබිය යුත්තේ කවර බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ වෙනත් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ බලයලත් වෙළෙන්දාගේ, පරිසීමිත වෙළෙන්දාගේ හෝ වෙනත් තැනැත්තාගේ නම සහ ලිපිනය ද;

(ආ) විමර්ශනය සිදු කරනු ලබන පරිශ්‍රයේ ලිපිනය ද;

(ඇ) විමර්ශනය කරන බලයලත් තැනැත්තාගේ නම ද; සහ

(ඈ) (i) බලයලත් තැනැත්තා ඉදිරියේ ඒ වෙළෙන්දා හෝ තැනැත්තා පෙනී සිටීම සඳහා;

(ii) මහ බැංකුව වෙත හෝ බලයලත් තැනැත්තා වෙත පොත් සහ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා;

(iii) මේ වගන්තිය යටතේ විමර්ශනයක් කරනු ලබන බලයලත් තැනැත්තකුට බාධා කිරීමක් වැළැක්වීම සඳහා,

වූ නියෝගයක් කිරීම පිණිස අයැදුමක්,

අන්තර්ගත විය යුතු ය.

(8) (අ) (6) වන සහ (7) වන උපවගන්ති යටතේ කරන ලද ඉල්ලීමක් සැලකිල්ලට ගැනීමෙන් පසු අධිකරණය විසින් (7) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අයැද ඇති නියෝගයක් කළ හැකි අතර එකී වෙළෙන්දා හෝ තැනැත්තා අප්‍රමාදීව එම නියෝගය අනුව ක්‍රියා කළ යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ වන අධිකරණ නියෝගයකට අනුව ක්‍රියා කිරීමට අසමත් වන ඕනෑම වෙළෙන්දකු හෝ තැනැත්තකු වරදකට වරදකරු වන අතර වරදකරු කිරීමේ දී රුපියල් පන් ලක්ෂය නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ වන වරදක් සන්තතන වරදක් වන අවස්ථාවක දී එම වෙළෙන්දා හෝ තැනැත්තා එම වරද සිදු කෙරෙන සෑම දිනයක් සඳහා ම රුපියල් එක් ලක්ෂය බැගින් වන අමතර දඩ මුදලක් ගෙවීමට යටත් විය යුතු ය.

පනතේ විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද නියෝගයක්, නියමයක්, විධානයක්, මාර්ගෝපදේශයක් ආදියට අනුකූලව ක්‍රියා කිරීමට අසමත් වීම.

**11.** (1) යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් -

(අ) මේ පනතේ විධිවිධානවලට පටහැනිව ජංගම ගනුදෙනුවක දී හෝ ප්‍රාග්ධන ගනුදෙනුවක දී විදේශ විනිමය වෙළෙඳමේ නිරත වීම;

(ආ) මේ පනතේ විධිවිධානවලට පටහැනිව විදේශ වත්කම් සම්බන්ධ විදේශ විනිමය වෙළඳාමේ නිරත වීම;

(ඇ) 9 වන වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උපවගන්ති යටතේ නිකුත් කරන ලද යම් මාර්ගෝපදේශයක් හෝ විධානයක් හෝ (4) වන උපවගන්තිය යටතේ වන යම් නියම කිරීමක් ඉටු කිරීමට අසමත් වීම;

(ඇ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ නියමයක් උල්ලංඝනය කිරීම,

සිදු කරන බවට මහ බැංකුව විසින් සෑහීමට පත්වනු ලබන අවස්ථාවක දී, අමාත්‍යවරයා වෙත දනුම් දීමෙන් අනතුරුව මහ බැංකුව විසින්, එහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද නියෝගයකට, නියමයකට, මාර්ගෝපදේශයකට හෝ විධානයකට අනුකූලව ක්‍රියා කරන ලෙස විධාන කරන දැන්වීමක්, එම බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා වෙත නිකුත් කළ හැකි ය.

(2) යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමකට අනුව ක්‍රියා කිරීමට අසමත් වන අවස්ථාවක දී, මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳාම් කිරීම සඳහා 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ප්‍රදානය කරන ලද බලය ලබාදීම හෝ 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ප්‍රදානය කරන ලද අවසර දීම තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ තාවකාලිකව අත්හිටුවීමක් සිදුකර ඇති අවස්ථාවක දී, මහ බැංකුව විසින් බලයලත් වෙළෙන්දාට හෝ පරිසීමිත වෙළෙන්දාට සවන් දීම පිණිස සාධාරණ අවස්ථාවක් ලබා දීමෙන් අනතුරුව සහ මුදල් මණ්ඩලයේ අනුමතය සහිතව 4 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද බලය දීම හෝ අවසර දීම ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද අවස්ථානුගත කරුණු අනුව, මහ බැංකුව විසින්, (3) වන උපවගන්තිය යටතේ බලය දීම හෝ අවසර දීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිණිස කටයුතු නොකොට සවන් දෙනු ලැබීමට සාධාරණ අවස්ථාවක් ලබා දීමෙන් අනතුරුව සහ අදාළ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන මහ බැංකුව විසින් යෝග්‍ය යයි සලකනු ලබන්නේ නම් -

(අ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් පරිදි මේ පනතේ විධිවිධානවලට පටහැනිව විදේශ වත්කම් සම්බන්ධ වෙළෙඳාමේ යෙදෙන බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට, ඒ විදේශ වත්කමේ හෝ ඉන් යම් කොටසක මුදල හෝ වටිනාකම නොඉක්මවන මුදලක් සහ ඒ ගනුදෙනුව අනාවරණය කර ගැනීමෙහි සහ විමර්ශනය කිරීමෙහි ලා මහ බැංකුව විසින් දරන ලද

යම් වියදමක් ද ඒ නියමයේ නිශ්චිතව සඳහන් කාලය තුළ දී විදේශ විනිමයෙන් හෝ ශ්‍රී ලංකා ව්‍යාවහාර මුදලින් මහ බැංකුව වෙත ගෙවන ලෙස නියම කළ හැකි ය; හෝ

(ආ) ඒ නීති විරෝධී ගනුදෙනුවට ඍජුව හෝ වක්‍රව පාර්ශ්වයක් වූ බලයලත් වෙළෙන්දාට හෝ පරිසීමිත වෙළෙන්දාට අවස්ථාවෝචිත පරිදි, විදේශ විනිමයට අදාළව, ජංගම හෝ ප්‍රාග්ධන ගනුදෙනුවල වෙළෙඳාම් කිරීමෙන් හෝ ඒවායෙහි නිරතව සිටීමෙන් මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා සීමාවක් පැනවිය හැකි ය.

(5) බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන වෙනත් යම් තැනැත්තකු, තැනැත්තන් වර්ගයක් හෝ වර්ග විසින් (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේද උල්ලංඝනය කරමින් ක්‍රියා කරනු ලැබ ඇති අවස්ථාවක දී, මහ බැංකුව විසින්, අමාත්‍යවරයා වෙත දැනුම් දීමෙන් අනතුරුව සහ එම තැනැත්තාට සවන්දීම සඳහා සාධාරණ අවස්ථාවක් ලබා දීමෙන් පසු, රුපියල් මිලියනයකට නොවැඩි මුදලක් හෝ එකී ජංගම ගනුදෙනුව හෝ ප්‍රාග්ධන ගනුදෙනුව අනාවරණය කිරීමෙහි සහ විමර්ශනය කිරීමෙහි ලා මහ බැංකුවට උපචිත වූ යම් වියදම් ද ඇතුළුව එම ජංගම ගනුදෙනුවේ හෝ ප්‍රාග්ධන ගනුදෙනුවේ ප්‍රමාණය හෝ වටිනාකම හෝ විදේශ විනිමයෙන් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යාවහාර මුදලින් වූ එකී විදේශ වත්කමේ හෝ එහි යම් කොටසක වටිනාකම නොඉක්මවන මුදලක් දඩයක් වශයෙන් ගෙවන ලෙස එකී තැනැත්තාට ලිඛිතව නියම කළ හැකි ය.

(6) මහ බැංකුව විසින්, (3) වන උපවගන්තිය යටතේ බලය දීමක් හෝ අවසර දීමක් ප්‍රත්‍යාදිෂ්ට කරන හෝ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ තීරණය කරන ලද යම් මුදලක් ගෙවන ලෙස නියම කරන හෝ (4) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සීමා කිරීමක් පනවනු ලබන හෝ අවස්ථාවක, තම තීරණය හෝ නිශ්චය කිරීම ඒ සඳහා වූ හේතු ද සමඟ, මහ බැංකුව විසින් ඒ බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා වෙත ලිඛිතව දැන්විය යුතු ය.

(7) (අ) යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු–

(i) (3) වන උපවගන්තිය යටතේ බලය දීමක් හෝ අවසරදීමක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හේතුවෙන් අගතියට පත් වූ අවස්ථාවක දී;

(ii) (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නිශ්චය කරන ලද මුදලක් ගෙවන ලෙස කරන ලද නියමයකින් අගතියට පත් වූ අවස්ථාවක දී; හෝ

(iii) (4) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පනවන ලද සීමා කිරීමකින් අගතියට පත් වූ අවස්ථාවක දී,

අවස්ථාවෝචිත පරිදි, එම වෙළෙන්දාට එම තීන්දුව හෝ තීරණය දැනුම් දීමෙන් පසුව දින තිහක් තුළ එම ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ නිශ්චය කිරීමට එරෙහිව පරීක්ෂණ මණ්ඩලය වෙත අභියාචනා කරනු ලැබිය හැකි අතර පරීක්ෂණ මණ්ඩලය විසින් 13 වන වගන්තියේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුව ඒ අභියාචනය නිශ්චය කළ යුතු ය.

(ආ) බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන වෙනත් යම් තැනැත්තකු, (5) වන උපවගන්තිය යටතේ පනවන ලද දඩයක් හේතුවෙන් අගතියට පත් වූ අවස්ථාවක දී, ඒ තැනැත්තා වෙත ඒ දඩය ගෙවන ලෙස නියම කර දන්වනු ලැබීමෙන් පසු දින තිහක් තුළ එම දඩය ගෙවන ලෙස කරන ලද නියමයට එරෙහිව පරීක්ෂණ මණ්ඩලය වෙත අභියාචනය කරනු ලැබිය හැකි අතර පරීක්ෂණ මණ්ඩලය විසින් 13 වන වගන්තියේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුව ඒ අභියාචනය නිශ්චය කළ යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ අභියාචනයක් සම්බන්ධයෙන් වූ නියෝගයකට යටත්ව, (3) වන උපවගන්තිය යටතේ බලය දීමක් හෝ අවසර දීමක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ (4) වන උපවගන්තිය යටතේ යම් සීමා කිරීමක් පැනවීම, ඒ අභියාචනය නොතකා, බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා වෙත අවස්ථාවෝචිත පරිදි එම ප්‍රත්‍යාදිෂ්ට කිරීම සිදු කරනු ලැබූ හෝ සීමා කිරීම පනවනු ලැබූ දින සිට බල පැවැත්විය යුතු ය.

(9) (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මහ බැංකුව වෙත ගෙවන ලද යම් මුදලක් හෝ (5) වන උපවගන්තිය යටතේ ගෙවනු ලැබූ යම් දඩයක් ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු ය.

මාස හයක් ඇතුළත අවසන් කළ යුතු විමර්ශන සහ විමසුම්.

**12.** 11 වන වගන්තිය යටතේ වන සියලු විමර්ශන සහ පරීක්ෂණ අමාත්‍යවරයාගේ අනුමතය සහිතව කාලය දීර්ඝ කිරීමක් ලබා ගෙන ඇත්තේ නම් මිස එම විමර්ශනය හෝ පරීක්ෂණය ආරම්භ වූ දිනයේ සිට මාස හයක කාල සීමාවක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

පරීක්ෂණ මණ්ඩලය.

**13.** (1) 11 වන වගන්තියේ (7) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ කරන ලද අභියාචනා විභාග කිරීම සඳහා අමාත්‍යවරයා විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙක්; සහ

(ආ) ජාත්‍යන්තර මූල්‍ය හෝ විනිමය ගනුදෙනුවලට අදාළ කාරණා සම්බන්ධයෙන් මනා දැනුමක් ඇති සහ රාජ්‍ය සේවයෙහි හෝ පුද්ගලික අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබෙන හා මනා තත්ත්වයක සිටින සහ කීර්තියක් දරන තැනැත්තන් දෙදෙනෙක්.

(3) පරීක්ෂණ මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම, මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් ධුරය පූර්වයෙන් අත්හරිනු ලබන්නේ නම් මිස ඔහු ධුරයට පත්කරනු ලැබූ දින සිට වසර තුනක කාලයක් සඳහා ධුරය දරනු ලැබිය යුතු අතර ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් මිස නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ එම ගාස්තුවලට අනුව පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් වෙත ගෙවීම් සිදු කරනු ලැබිය යුතු ය.

(5) යම් තැනැත්තෙක් —

(අ) පාර්ලිමේන්තුවේ හෝ යම් පළාත් සභාවක හෝ යම් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයකු වන අවස්ථාවක හෝ එසේ වීම මත; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නොවන්නේ නම් හෝ පුරවැසිභාවය අහෝසි වීම මත; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ මානසික දුබලතාවයකින් පෙළෙන බවට සොයා ගනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණය විසින් පනවා ඇති සිරදඬුවමකට යටත්ව සිටින හෝ යටත්ව සිටිනු ලැබ ඇත්නම්; හෝ

(ඉ) මණ්ඩලයේ සාමාජිකයෙක් වශයෙන් ඔහුගේ කර්තව්‍යයන් ඉටු කිරීම කෙරෙහි අගතිකාරී ලෙස බලපාන්නා වූ යම් මූල්‍යමය හෝ වෙනත් යම් බැඳියාවක් ඇත්නම්,

එවැනි තැනැත්තකු පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ තවදුරටත් එලෙස ක්‍රියා කරනු ලැබීමට නුසුදුසු විය යුතු ය.

(6) (අ) පරීක්ෂණ මණ්ඩලයේ යම් සාමාජිකයකුට අමාත්‍යවරයා වෙත ඒ සම්බන්ධයෙන් යොමු කරනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක දී තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එවැනි ඉල්ලා අස්වීමක් අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගැනීමෙන් බලාත්මක විය යුතු ය.

(ආ) අමාත්‍යවරයා විසින් හේතු දැක්වීමක් සහිතව යම් පත් කරන ලද සාමාජිකයකු ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඇ) මිය යාම, ඉල්ලා අස්වීම, ඉවත් කිරීම හෝ (5) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමෙන් පරීක්ෂණ මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුගේ යම් ධුරයක් පුරප්පාඩු වූ අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් (2) සහ (3) උපවගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඊට පෙර එම ධුරය දැරූ සාමාජිකයාගේ ඉකුත් නොවූ ධුර කාලය සඳහා එම ධුරය දැරීමට වෙනත් පුද්ගලයකු පත් කරනු ලැබිය හැකිය.

(ඈ) පරීක්ෂණ මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයෙක් හට යම් කාලසීමාවක් තුළ දී අසනීප තත්ත්වයෙන් පසුවීම, ශ්‍රී ලංකාව තුළ නොසිටීම හෝ වෙනත් යම් හේතුවක් මත තාවකාලිකව තම ධුරයේ වගකීම් ඉටුකිරීමට නොහැකි වන්නේ නම්, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට එම ඉකුත් නොවූ කාලසීමාව සඳහා ක්‍රියා කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකිය.

(7) පරීක්ෂණ මණ්ඩලය විසින් අභියාචනය ලැබී දින තිහක කාලසීමාවක් තුළ එම කාරණාව සම්බන්ධයෙන් සිය තීරණය ගනු ලැබිය යුතු ය.

(8) සෑම අභියාචකයකු විසින් ම පුද්ගලිකව ම හෝ බලයලත් නියෝජිතයකු මාර්ගයෙන් පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(9) අභියාචනය විභාග කිරීමෙන් අනතුරුව, පරීක්ෂණ මණ්ඩලය විසින් අභියාචනය කරනු ලැබූ තීන්දුව තහවුරු කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රතිවර්තනය කරනු ලැබිය හැකි ය.

(10) පරීක්ෂණ මණ්ඩලයේ තීරණය සහ ඊට අදාළ හේතු ලිඛිතව තිබිය යුතු අතර, එම තීරණය අභියාචකට දැනුම් දිය යුතු අතර ඒ සම්බන්ධව වාර්තාවක් පරීක්ෂණ මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ මණ්ඩලවල වගකීම.

**14.** 11 වන සහ 13 වන වගන්ති යටතේ යම් මුදලක් හෝ දඩයක් මහ බැංකුව වෙත ගෙවීමට නියම කරනු ලැබ ඇති යම් තැනැත්තකු සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක් වන අවස්ථාවක දී, එවැනි මණ්ඩලයක සෑම අධ්‍යක්ෂවරයෙක්, සාමාජිකයෙක් හෝ හවුල්කරුවෙක් ම පෞද්ගලිකව ම, එක්ව සහ වෙන් වෙන්ව එම මුදල හෝ වටිනාකම සහ වියදම් ගෙවීමට යටත් විය යුතු ය:

එසේ වුව ද, එම වගකීම දැරීමට හේතු වූ ක්‍රියාව හෝ නොකර හැරීම සිදු කරනු ලැබුවේ හෝ සිදු කිරීම පැහැර හරිනු ලැබුවේ එම පුද්ගලයාගේ දැනුමෙන් තොරව බව හෝ එම පුද්ගලයා විසින් එම ක්‍රියාව හෝ නොකර හැරීම වැළැක්වීමට නිසි උද්‍යෝගයෙන් කටයුතු කළ බව එම පුද්ගලයා විසින් ඔප්පු කරනු ලැබුවහොත් එම අධ්‍යක්ෂවරයා, සාමාජිකයා හෝ හවුල්කරු එම මුදල හෝ වටිනාකම ගෙවීමට යටත් නොවිය යුතු ය.

ආණ්ඩුවට ලැබිය යුතු මුදල් අයකර ගැනීම.

**15.** (1) (අ) 11 වන හෝ 13 වන වගන්ති යටතේ මහ බැංකුවට ගෙවිය යුතු යම් මුදලක් හෝ දඩ මුදලක් ගෙවීම යම් තැනැත්තකු විසින් පැහැර හරින අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බවට නියම කෙරෙන මුදල දැක්වෙන සහතිකයක් තම අත්සනින් යුතුව නිකුත් කිරීම පිණිස මහ බැංකු අධිපතිවරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(ආ) එසේ සහතික කරන ලද මුදල ඒ තැනැත්තාගෙන් ආණ්ඩුවට අය විය යුතු ණයක් ලෙස සැලකිය යුතු අතර, එම තැනැත්තා වාසය කරනු ලබන දිස්ත්‍රික්කයේ අධිකරණ බලය හිමි දිසා අධිකරණයට සහතිකයක් නිකුත් කිරීම මගින් එම මුදල මහ බැංකුව විසින් අය කර ගනු ලැබිය හැකි ය.

(ඇ) එම සහතිකයේ අය විය යුතු මුදල පිළිබඳ විස්තර සහ 4 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලය ලබාදීමේ දක්වා ඇති පරිදි නම සහ පදිංචි ස්ථානය ඇතුළත් විය යුතු ය.

(ඈ) අය විය යුතු මුදල් ප්‍රමාණය අය කර ගැනීමට අවශ්‍ය වේ යැයි අධිකරණය විසින් සිතන පරිදි ණය ගෙවීම පැහැර හරින ලද තැනැත්තාගේ චංචල හෝ නිශ්චල සියලු දේපළ හෝ ඉන් කොටසක් තහනමට ගැනීමට හා විකිණීමට පිස්කල්වරයා වෙත බලය පවරමින් සහ අණ කරමින් ඇස්කීසි ආඥාවක් නිකුත් කිරීමට අධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු අතර එම තහනමට ගැනීම සහ විකිණීම සම්බන්ධයෙන් (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු වන්නා වූ මුදල අයකරවා ගැනීම අයෝග්‍ය හෝ නිෂ්ඵල බවට මහ බැංකුව විසින් අදහස් කරන්නේ නම් හෝ තහනමට ගැනීම සහ විකිණීම මගින් සම්පූර්ණ මුදල අයකරවා ගෙන නොමැති නම්, එවිට, එසේ අය විය යුතු මුදලේ විස්තර සහ 4 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලය ලබා දීමේ දක්වා ඇති පරිදි එම තැනැත්තාගේ නම සහ පදිංචි ස්ථානය අඩංගු වූ සහතිකයක් මහ බැංකුව විසින් අධිකරණ බලය හිමි මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(ආ) මේ පනත යටතේ ගෙවිය යුතු වන මුදල අයකරවා ගැනීම සඳහා එම තැනැත්තාට විරුද්ධව ඉදිරි නඩු කටයුතු සිදු නොකළ යුතු වීමට හේතු දක්වනු ලැබීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් එම තැනැත්තා ඔහු ඉදිරියට කැඳවිය යුතු අතර ප්‍රමාණවත් හේතු දැක්වීමට අපොහොසත් වීම මත, එම මුදල එම තැනැත්තා මත මහෙස්ත්‍රාත්වරයාගේ තීන්දුවක් මගින් පනවන ලද දඩයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එවැනි වරදක් සම්බන්ධව නියම කරන ලද දඩ මුදලක් ගෙවීමට අසමත් වීමට අදාළව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තිය (1 වන

උපවගන්තියේ (අ), (ඇ) සහ (එ) ඡේද හැර) අදාළ විය යුතු අතර එම උපවගන්තියේ විධිවිධාන මගින් එම තීන්දුව නියම කරන අවස්ථාවේ දී මහෙස්ත්‍රාත්වරයා හට සිදු කිරීමට හැකියාව තිබූ ඕනෑම නියම කිරීමක් සිදු කළ හැකි ය.

(3) (අ) මේ වගන්තියේ කාර්යය සඳහා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සහතිකයේ සඳහන් යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය අධිකරණය විසින් මේ යටතේ වූ කිසිදු නඩු කටයුත්තක දී ප්‍රශ්න කිරීම හෝ පරීක්ෂා කිරීම කරනු නොලැබිය යුතු අතර, ඒ අනුව මේ වගන්තියෙහි සඳහන් කිසිවක් එම සහතිකයේ ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය සැලකිල්ලට ගැනීමට හෝ තීරණය කිරීමට අධිකරණයට බලය ලබා නොදිය යුතු අතර ගෙවීම පැහැර හරින ලද තැනැත්තාගෙන් මේ පනත යටතේ අය විය යුතු මුදල නිවැරදිව ගණනය කර ඇති බවට සහ එම මුදල ගෙවීම පැහැර හැර ඇති බවට මහ බැංකුවේ සහතිකය ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(ආ) මහ බැංකු අධිපතිවරයා විසින් සහතිකය අත්සන් කරනු ලැබිය යුතු අතර එම නඩුවේ දී අත්සන ඔප්පු කිරීමකින් තොරව සාක්ෂි වශයෙන් පිළිගත යුතු අතර එහි සඳහන් කරුණු බැලූ බැල්මට පෙනෙන ඔප්පු කිරීමක් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ නඩුවක දී අයකර ගත් යම් මුදලක් ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

අවසරය, කැමැත්ත සහ බලය දීමට අදාළ විධිවිධාන.

**16.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ ප්‍රදානය කරන ලද යම් අවසරයක් කැමැත්තක් හෝ බලය දීමක්-

(අ) සාමාන්‍ය හෝ විශේෂ;

(ආ) නියත හෝ කොන්දේසි සහිත;

(ඇ) අලුත් නොකළහොත් නිශ්චිත දිනයක දී කල් ඉකුත් වන පරිදි සීමිත; සහ

(ඈ) වෙනස් කරන ලද්දක් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරන ලද්දක්,

විය හැකි ය.

අවසරදීම සම්බන්ධ ඔප්පු කිරීමේ භාරය.

**17.** 13 වන වගන්තිය යටතේ සිදු කරනු ලබන විභාග කිරීමක දී, යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන වෙනත් යම් තැනැත්තන් වර්ගයක් හෝ වර්ග, පනතේ හෝ ඒ යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද යම් නියෝගයක්, නියමයක්, මාර්ගෝපදේශයක් හෝ විධානයක් උල්ලංඝනය කිරීමක් වන්නා වූ

ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදු කිරීම සඳහා මහ බැංකුවේ අවසරය ලබාගෙන තිබුණු බව ඔප්පු කිරීමේ භාරය එම වෙළෙන්දා, තැනැත්තා හෝ තැනැත්තන් වර්ගය හෝ වර්ග මත විය යුතු ය.

විදේශ ව්‍යවහාර මුදල්වලට අදාළ පූර්වානුමිතිය.

**18.** 13 වන වගන්තිය යටතේ විදේශ ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන් සිදු කරනු ලබන විභාග කිරීමක දී, පනතේ විධිවිධාන හෝ පනත යටතේ නිකුත් කරනු ලබන හෝ සාදනු ලබන යම් නියෝගයක්, නියමයක්, මාර්ගෝපදේශයක් හෝ විධානයක් උල්ලංඝණය කරමින් සිදු කළ බවට චෝදනා කරනු ලබන විදේශ විනිමය වෙළෙඳාමක් සම්බන්ධයෙන් වූ මුදල් ඊට පටහැනි යැයි ඔප්පු කරනු ලබන තෙක් සත්‍ය ව්‍යවහාර මුදල් බවට පූර්වානුමිතික විය යුතු ය.

ඇතැම් ලේඛන අදාළ කර ගැනීම.

**19.** 13 වන වගන්තිය යටතේ වූ යම් විභාග කිරීමක දී හෝ 10 වන වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී පහත දැක්වෙන ලේඛනවලින් කිසිවක් පරීක්ෂණ මණ්ඩලය හෝ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන වෙනත් යම් තැනැත්තකු, තැනැත්තන් වර්ගයක් හෝ වර්ගවලට එරෙහිව එම ලේඛන සාක්ෂි ලෙස ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එය එහි අඩංගු කාරණා, ගනුදෙනු සහ ගිණුම් සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු යː-

(අ) බැංකු කළමනාකරුගෙන් හෝ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරිවරයාගෙන් ලබාගත් බැංකුකරුගේ පොතෙහි සහතික කරන ලද පිටපතක් හෝ එහි උද්ධෘතයක්;

(ආ) සමාගමක අධ්‍යක්ෂවරයාගෙන් හෝ ලේකම්වරයාගෙන් ලබා ගත් සමාගමක් විසින් පවත්වාගෙන යා යුතු බවට නීතියෙන් නියම කර ඇත්තා වූ යම් පොතක හෝ වෙනත් වාර්තාවක සහතික කළ පිටපතක් හෝ එහි සහතික කරන ලද යම් උද්ධෘතයක්; සහ

(ඇ) විදේශීය ආණ්ඩුවක නිලධරයකුගේ නිසි භාරයේ පවතින්නා වූ, සහ එම නිලධරයාගෙන් ලබාගත් යම් ලේඛනයක සහතික කළ පිටපතක් හෝ එහි උද්ධෘතයක්.

සද්භාවයෙන් සිදු කළ ක්‍රියා පිළිබඳ හානි පූරණය කිරීම.

**20.** මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මේ පනත මගින් හෝ ඒ යටතේ පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීම සද්භාවයෙන් සිදු කරන ලද බව හෝ සිදු කළේ යැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කිසිදු තැනැත්තකු යම් නඩු පැවරීමක දී හෝ වෙනත් නීති කෘත්‍යයක දී වගකීමට යටත් නොවිය යුතු ය.

නිලධරයන් සහ සේවකයන් විසින් රහස්‍යභාවය ආරක්ෂා කළ යුතු බව.

**21.** (1) මේ පනත යටතේ සිය කාර්ය ඉටු කිරීමේ දී හැර, මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ සෑම නිලධරයකු සහ සේවකයකු විසින් ම, මේ පනත යටතේ සිය කාර්ය ඉටු කිරීමේ දී ඔහුට දැන ගැනීමට ලැබිය හැකි සියලු කාරණා සම්බන්ධයෙන් වූ රහසිගත බව ආරක්ෂා කිරීම සහ ආරක්ෂා කිරීමට ආධාර කිරීම සිදු කළ යුතු අතර හා එබඳු කාරණයක් -

(අ) එම කාරණය අදාළ වන්නා වූ තැනැත්තා, තැනැත්තන්, වර්ගයක් හෝ වර්ග හෝ එම තැනැත්තාගේ හෝ තැනැත්තන් වර්ගයක හෝ වර්ගවල බලයලත් නියෝජිතයකුට;

(ආ) මුදල් මණ්ඩලයට;

(ඇ) මහ බැංකු අධිපතිවරයා හෝ එම කාරණය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා මහ බැංකු අධිපතිවරයා විසින් බලය පවරන ලද මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට;

(ඈ) මහ බැංකුව විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට;

(ඉ) එම කාරණය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා අමාත්‍යවරයා විසින් බලය පවරන ලද රජයේ නිලධරයකුට; හෝ

(ඊ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් හා අනුකූලවීම තහවුරු කිරීමේ හෝ පැහැර හැරීම අනාවරණය කර ගැනීමේ කාර්ය සඳහා එම කාරණය සන්නිවේදනය කිරීම අවශ්‍ය වන්නා වූ තැනැත්තකුට,

හැර යම් නිසි බලය නොපවරන ලද තැනැත්තකුට ඉහත කී දෙපාර්තමේන්තුවේ හෝ එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සන්තකයේ හෝ භාරයේ හෝ පාලනය යටතේ පවතින යම් පොතකට, ලියවිලිවලට හෝ වාර්තාවලට ප්‍රවේශ වීම සඳහා ඉඩහරින හෝ අවසර ලබාදෙනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලැබේ.

(2) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධරයකු හෝ සේවකයකු, මුදල් මණ්ඩලය පාර්ශ්වයක් නොවන්නා වූ යම් නඩුවක දී, යම් පොතක් හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීම සඳහා හෝ මේ පනත යටතේ සිය කාර්ය ඉටු කිරීමේ දී ඔහු විසින් දැනගනු ලබන යම් කාරණයක් හෙළිදරව් කිරීම සඳහා හෝ සන්නිවේදනය කිරීම සඳහා අධිකරණය විසින් කරනු ලබන නියෝගයක දී හැර සාක්ෂිකරුවකු ලෙස කැඳවනු නොලැබිය යුතු ය.

මූල්‍ය ස්ථාවරත්වය සුරැකීම.

**22.** (1) ශ්‍රී ලංකාව තුළට හෝ ශ්‍රී ලංකාවෙන් පිටට විදේශ විනිමය ප්‍රේෂණය කිරීම මුදල් මණ්ඩලයේ මතය පරිදි, ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථාවරත්වයට තර්ජනයක් එල්ල විය හැකි බවට මුදල් මණ්ඩලය විසින් අමාත්‍යවරයාට උපදෙස් දෙනු ලබන අවස්ථාවක, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව සහ මේ පනතේ 5 වන, 6 වන, 7 වන හා 8 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකාව තුළට හෝ ශ්‍රී ලංකාවෙන් පිටට විදේශ විනිමය ප්‍රේෂණය කිරීම ඒ නියමයේ දින සිට මාස හයකට වැඩි නොවන කාලසීමාවක් සඳහා සීමා කිරීම හෝ විධිමත් කිරීම පිණිස අවශ්‍ය විය හැකි පියවර ගත යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් නොපමාව පාර්ලිමේන්තුව වෙත දැනුම් දිය යුතු අතර, පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරන්නේ නම් මිස, ඒ නියමයේ සඳහන් කාලසීමාව සඳහා එය වලංගුව පැවතිය යුතු ය.

(3) පාර්ලිමේන්තුවේ අනුමතය ඇතිව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් කලින් කල (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයේ වලංගුභාවය දීර්ඝ කරනු ලැබිය හැකි ය; එසේ වුව ද එලෙස දීර්ඝ කරනු ලබන කාලසීමාවේ එකතුව මාස දොළහ නොඉක්මවිය යුතු ය.

සිවිල් හෝ අපරාධ නඩු සඳහා දරන වියදම්, ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු බව.

**23.** (1) යම් අධිකරණයක් ඉදිරියේ දී මහ බැංකුව විසින් හෝ එයට එරෙහිව පවරනු ලබන සිවිල් හෝ අපරාධ නඩුවක දී මහ බැංකුව විසින් දරනු ලබන වියදම් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මහ බැංකුවට ගෙවන ලද හෝ මහ බැංකුව විසින් අය කරගන්නා යම් නඩු ගාස්තුවක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත හෝ වෙන යම් ලිඛිත නීතියක් යටතේ හෝ මහ බැංකුවේ විධානයක් ප්‍රකාරව, මහ බැංකුවේ සේවා නියුක්තිකයන් විසින් කරන ලද හෝ කරතැයි අරමුණු කරගත් යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් ඉදිරියේ දී එම තැනැත්තාට එරෙහිව පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී දරන ලද වියදම් එකී ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම තැනැත්තා විසින් එම වියදම් අයකර ගනු ලැබිය හැක්කේ නම් මිස, ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**24.** (1) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව බැංකුවේ අවසරය හෝ කැමැත්ත ගිවිසුමේ යම් වේලාවක දී එහි යම් නියමයක් ඉටු කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන අවස්ථාවක ඒ නියමය, අවසරය හෝ කැමැත්ත දෙන ලද්දේ කවර තාක් දුරට ද ඒ දුරට හැර නැතහොත් අවශ්‍ය නොකරන ප්‍රමාණයට එකී නියම ඉටු නොකළ යුතු ය යන්න යම් ගිවිසුමක ව්‍යංජිත කොන්දේසියක් විය යුතු ය: ගිවිසුම්.

එසේ වුව ද, මේ වගන්තියේ මීට ඉහතින් ම වූ විධිවිධාන ඒ නියමයට අදාළ කිරීම ගිවිසුමට පාර්ශ්වකරුවන් වූ තැනැත්තන්ගේ චේතනාව සමඟ අනනුකූල වන තාක් දුරට ඒ විධිවිධාන මේ පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද ඒ නියමය ඉටු කිරීම ඒවායින් බලාපොරොත්තු වූ හේතුවෙන් වුවත් නොඑසේ නම් වෙනත් හේතුවක් නිසා වුවත් ඒ නියමයට අදාළ නොවිය යුතු ය.

(2) (82 වන අධිකාරය වූ) විනිමය බිල්පත් ආඥා පනතේ කුමක් සඳහන් ව තිබුන ද මේ පනතේ විධිවිධාන හෝ යම් කොන්දේසියක් ඒ කොන්දේසිය හෝ ඒ විධිවිධාන සැලකිල්ලට ගැනීමේ දී කිසිදු ගෙවීමක් මේ පනත යටතේ බැංකුවේ අවසරය නොමැතිව නොගෙවිය යුතු ය යන්න ප්‍රකාශිත හෝ ව්‍යංජිත වුව ද නොවුව ද, විනිමය බිල්පතක් හෝ පොරොන්දු පත්‍රයක් යම් සාධන පත්‍රයක් වීම එම ආඥා පනත යටතේ වළක්වාලන ලද්දේ යයි සැලකිය යුතු ය.

**25.** යම් ක්‍රියාවක් කිරීම සම්බන්ධයෙන් සහ මේ පනතේ බලය ප්‍රකාරව යම් ක්‍රියාවක් ඉටු කිරීම සඳහා බැංකුවේ අවසරය හෝ කැමැත්ත අවශ්‍ය කරන බවට බැඳීමක් වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක් මගින් පනවනු ලබන අවස්ථාවක, එම අවසරය හෝ කැමැත්ත දෙනු ලබන තාක් දුරට හෝ අවශ්‍ය නොකරන තාක් දුරට ඉටු නොකරන බව ඒ බැඳීමේ ව්‍යංජිත කොන්දේසියක් විය යුතු ය. වෙනත් ලිඛිත නීති යටතේ බැඳීම්.

**26.** (1) මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද යම් නියෝගයන්ට, නියමයන්ට හෝ විධානයන්ට පටහැනිව ක්‍රියා කරනු ලබන, තැනැත්තකුට, ඒ සඳහා දඩයක් නියම කරනු ලැබ නොමැති අවස්ථාවක දී, සහ බැංකුව විසින්, ලිඛිතව එම දැන්වීමේ සඳහන් කරනු ලැබිය හැකි කාලසීමාවක් තුළ, රුපියල් මිලියනයකට නොවැඩි මුදලක් දඩයක් වශයෙන් ගෙවන ලෙස එම තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය. දණ්ඩන.

(2) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද දඩයක් හේතුවෙන් අගතියට පත් යම් තැනැත්තකුට ඒ තැනැත්තා වෙත ඒ දඩය ගෙවන ලෙස නියම කර දක්වනු ලැබීමෙන් පසු දින තිහක් තුළ එම දඩය ගෙවන ලෙස කරන ලද නියමයට එරෙහිව පරීක්ෂණ මණ්ඩලය වෙත අභියාචනය කරනු ලැබිය හැකි අතර, පරීක්ෂණ මණ්ඩලය විසින් 13 වන වගන්තියේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුව ඒ අභියාචනය නිශ්චය කළ යුතු ය.

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් උපලේඛන සංශෝධනය කිරීම.

**27.** මේ පනතේ උපලේඛන ජාතික ආර්ථිකයේ යහපත උදෙසා කලින් කල පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ සකස් කිරීම කළ හැකි ය.

නියම දිනපතා පුවත්පත්වල පළ කිරීම.

**28.** මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ නියමයක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමට නියම කරනු ලැබ ඇති අවස්ථාවක එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු සිංහල, දෙමළ හා ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනක එක් වරක් පළ කරනු ලැබිය යුතු ය.

නියෝග.

**29.** (1) නියමිත යයි මේ පනතින් නියම කර ඇති සියලු කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ නියම කර ඇති හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර ඒ නියෝගය එසේ පළ කරන ලද දිනයේ දී හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

**30.** (1) (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

ඉවත් කිරීම සහ ඉතිරි කිරීම.

(2) ඉහත සඳහන් පනතේ ඉවත් කිරීම නොතකා -

(අ) ඉවත් කරන ලද පනත යටතේ පවරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවත්නා සියලු සිවිල් නඩු, අපරාධ නඩු සහ නීති කෘත්‍ය, නියමිත දිනයේ සිට ඉවත් කරන ලද පනත යටතේ වූ සියලු සිවිල් නඩු, අපරාධ නඩු සහ නීති කෘත්‍ය, ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී පනත යටතේ අසා නිම කළ යුතු ය; සහ

(ආ) ඉවත්කරන ලද පනත යටතේ පවරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවත්නා වූ සියලු විමර්ශන සහ පරීක්ෂණ නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි ඉවත් කරන ලද පනත යටතේ පවරන ලද විමර්ශන සහ පරීක්ෂණ ලෙස සලකනු ලැබිය යුතු අතර, නියමිත දින සිට මාස හයක් ඇතුළත එකී පනත යටතේ අසා සිට නිම කරනු ලැබිය යුතු ය.

**31.** (1) මේ පනතේ කාර්යය සඳහා -

ව්‍යවහාර මුදල් සුරැකුම්පත් ආදිය.

(අ) "ව්‍යවහාර මුදල්" යන්නට කාසි, ව්‍යවහාර මුදල් නෝට්ටු, තැපැල් ඇණවුම්, මුදල් ඇණවුම්, චෙක්පත්, බැංකු අණකර, සංචාරක චෙක්පත්, ණයවර ලිපි, විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, අනෙකුත් ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු කාඩ්පත් සහ ඩිජිටල් ව්‍යවහාර මුදල් ඇතුළත් විය යුතු ය;

(ආ) "සුරැකුම්පත්" යන්නෙන් කොටස්, ව්‍යාපාර වස්තු, බැඳුම්කර, ණයකර, ඒකක භාර සැලසුම් යටතේ වන ඒකකයන් හෝ යම් අන්‍යොන්‍ය අරමුදල් අදහස් වේ.

(2) මහ බැංකුව විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයක් මගින් මේ පනතේ නිශ්චිතව දක්වා නොමැති ව්‍යවහාර මුදල් හෝ සුරැකුම්පත් වලට අදාළ වෙනත් යම් අයිතමයක් නිශ්චිතව දැක්විය යුතු ය.

(3) මේ පනතේ කාර්ය සඳහා "ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු" යන්නෙන් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයක් මගින් තීරණය කරනු ලබන යම් තැනැත්තකු අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**32.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**33.** මේ පනතෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"වත්කම" යන්නෙන් යම් වර්ගයක හෝ කවරාකාර විස්තරයක කිසියම් නිශ්චල හෝ චංචල දේපළක් අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නෙන් පනතේ 4 වන වගන්තියෙන් බලයලත් වෙළෙන්දකු ලෙස ක්‍රියා කිරීමට 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලය දෙන ලද බැංකුවක් අදහස් වේ;

"ප්‍රාග්ධන ගනුදෙනුව" යන්නෙන්, මේ පනතේ අර්ථය තුළ ජංගම ගනුදෙනුවක් නොවන්නා වූ ද යම් ජාත්‍යන්තර ගනුදෙනුවක් අදහස් වේ;

"මහ බැංකුව" යන්නෙන් (420 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 5 වන වගන්තියෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"ජංගම ගනුදෙනුව" යන්නෙන් ශ්‍රී ලංකාව තුළට සහ ඉන් බැහැරට විදේශ විනිමය මාරු කිරීම අවශ්‍ය කෙරෙන්නා වූ ද මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ව්‍යවස්ථාවලියේ XXX වන ව්‍යවස්ථාවේ (ඇ) ඡේදයේ සඳහන් වන්නා වූ ද යම් ජාත්‍යන්තර ගනුදෙනු කිරීමක් අදහස් වේ;

"දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්" යන්නෙන් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අර්ථානුකූලව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"විදේශ වත්කම්" යන්නෙන් යම් වර්ගයක හෝ කවරාකාර වූ හෝ විස්තරයක ශ්‍රී ලංකාවෙන් පිට යම් චංචල හෝ නිශ්චල දේපළක් අදහස් වන අතර ඊට මේ අර්ථ නිරූපණයේ මීට ඉහතින් ම වූ විධිවිධානවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, විදේශ විනිමය, විදේශ ව්‍යවහාර මුදල්, විදේශ සුරැකුම්පත් සහ විදේශ බැංකු ගිණුම් ද ඇතුළත් වේ;

"විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් හැර වෙනත් යම් ව්‍යවහාර මුදල් වර්ගයක් අදහස් වේ;

"විදේශ ව්‍යවහාර මුදල් ගිණුම" යන්නෙන් විදේශ විනිමයෙන් වෙළඳාම් කිරීම පිණිස බලය දී ඇති බලපත්‍රලාභී බැංකුවක ඇති විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් අදහස් වේ;

"විදේශ විනිමය" යන්නෙන් විදේශ ව්‍යවහාර මුදල් අදහස් වන අතර, ඊට -

(අ) තැන්පත්, බැරකිරීම් හා විදේශ ව්‍යවහාර මුදලින් ගෙවිය යුතු ශේෂ;

(ආ) ශ්‍රී ලංකාවේ දී අණ කරනු ලැබුවා වූ ද විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකාවෙන් පිට දී ගෙවිය යුතු වන්නා වූ ද අණකර, සංචාරක චෙක්පත්, ණයවර ලිපි හා විනිමය බිල්පත්;

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත දී අණ කරනු ලැබුවා වූ ද එනමුත් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකාවේ දී ගෙවිය යුතු වන්නා වූ ද අණකර, සංචාරක චෙක්පත්, ණයවර ලිපි හා විනිමය බිල්පත්;

(ඈ) අරමුදල් ජාත්‍යන්තර වශයෙන් මාරු කිරීම සඳහා සාමාන්‍ය වශයෙන් භාවිත කරනු ලබන වර්ගයක යම් ලේඛනයක් හෝ සාධන පත්‍රයක්,

ඇතුළත් වේ;

"විදේශ විනිමය වෙළෙඳාම", යන්නෙන් විදේශ විනිමය පිළිගැනීම, මිලට ගැනීම, විකිණීම, ණයට ගැනීම සහ ණයට දීම සහ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකට හුවමාරු කිරීම ඇතුළත් වේ;

"විදේශ සුරැකුම්පත්" යන්නෙන් විදේශ ව්‍යවහාර මුදලින් අධිනාමික හෝ ප්‍රකාශිත සහ ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කරන ලද සුරැකුම්පතක් අදහස් වේ;

"බලපත්‍රලාභී බැංකුවක්" යන්නෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ 2 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ බලපත්‍රලත් බැංකුවක් අදහස් වේ;

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ 76අ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ බලපත්‍රලත් බැංකුවක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන් මහ බැංකුව විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන් මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"අවසරය" යන්නෙන් 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පරිසීමිත වෙළෙන්දකුට ප්‍රදානය කර ඇති අවසරයක් අදහස් වේ;

"තැනැත්තා" යන්නෙන් හවුල් ව්‍යාපාරයක් ඇතුළුව යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තකු අදහස් වේ;

"ශ්‍රී ලංකාවෙන් පිට නේවාසික තැනැත්තා" යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු අදහස් වේ; සහ

"ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල්" යන්නෙන් රුපියල්වලින් ප්‍රකාශයට පත් කරන හෝ අණ කරනු ලබන ව්‍යවහාර මුදල් අදහස් වේ.

උපලේඛනය

(5 වන, 6 වන සහ 33 වන වගන්ති)

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදල**

**ගිවිසුම් ව්‍යවස්ථාවලිය**

**XXX වන වගන්තිය**

**පැහැදිලි කිරීම.**

(ඇ) ජංගම ගනුදෙනු සඳහා ගෙවීම් යන්නෙන් ප්‍රාග්ධන වත්කම් පැවරීමේ කාර්යය සඳහා නොවන සහ සීමා කිරීම් රහිතව පහත සඳහන් දෑ ඇතුළත් වේ:—

(1) විදේශීය වෙළෙඳාමට, සේවා සහ සාමාන්‍ය කෙටිකාලීන බැංකු සහ ණය පහසුකම් ඇතුළුව ජංගම ව්‍යාපාර හා සම්බන්ධ ගෙවිය යුතු සියලු ගෙවීම්;

(2) ණය මත වන පොළිය ලෙස සහ අනෙකුත් ආයෝජනයන්ගෙන් වන ශුද්ධ අදායම් ලෙස ගෙවිය යුතු ගෙවීම්;

(3) ණය හිලව් කිරීම සඳහා හෝ සෘජු ආයෝජන ක්ෂය වීම් සඳහා සීමිත මුදල් ප්‍රමාණයක් ගෙවීම; සහ

(4) පවුල් ජීවන වියදම් සඳහා සීමිත ප්‍රේෂණයන්.

අරමුදලට, අදාළ සාමාජිකයන් විමසීමෙන් පසු කිසියම් නිශ්චිත ගනුදෙනු, ජංගම ගනුදෙනු ලෙස හෝ ප්‍රාග්ධන ගනුදෙනුවක් ලෙස සලකනු ලැබිය හැකි දැයි නිශ්චය කළ හැකි ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.